ගොවි කටයුතු අධ්‍යයනය 1 (1) 1984, 1 – 7

# ගැමි සංවිධාන හා කෘෂිකාර්මික සංවර්ධනය: ගල්ගමුව සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය පිළිබඳ විමර්ශනයක්*

රංජිත් කුමාරසිරි පතිරණ

කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි ගැමි සංවිධානයන්ගෙන් ඇතිවන පිටුවහල පිළිබඳව විමර්ශනයක යෙදීම මේ ලිපියේ අරමුණ ය. නියාමක ව්‍යාපෘතියක් වශයෙන් 1980 දී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ගොවිජන සේවා කොට්ඨාශය තුල හඳුන්වා දුන් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය ආශ්‍රයෙන් ලැබූ අත්දැකීම්, ගැටළු හා සාර්ථක ප්‍රතිඵල විමර්ශනයට ලක් කරමින් කෘෂි කාර්මික සංවර්ධන කාර්යයේදී ගැමි සංවිධානවල කාර්යභාරය මෙහිදී සාකච්ඡාවට භාජනය වේ. මෙම ලිපිය ප්‍රධාන කාණ්ඩයන් තුනකි. පළමුව ශ්‍රී ලංකාවේ මේ දක්වා ක්‍රියාත්මක වූ ගැමි සංවිධාන ද, දෙවනුව එම සංවිධාන හා සුළු පරිමාණ ගොවි සංවිධාන අතර සැසඳීමක් ද, අවසාන වශයෙන් සුළු පරිමාණ ගොවි සංවිධාන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී දක්වන වැදගත්කම ද මෙහිදී සාකච්ඡාවට භාජන වේ.

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් වැසි ජලයෙන් යැපෙන කෘෂිකාර්මික රටක් ලෙස සිය කෘෂිකාර්මික ආර්ථික සංවර්ධනය ගොඩ නගා ගත් බව පැරණි වාරි මාර්ග රටාව පැහැදිලි කරයි. එම ජීවන ක්‍රමය තුළ සාමූහික ජීවන රටාවක් ශතවර්ෂ ගණනාවක් තිස්සේ ස්ථාපනය වූයේ නමුදු, වරින් වර ඇතිවූ පරසතුරු ආක්‍රමණ ආදියත්, යටත් විජිතයක් වශයෙන් අසරණ වීමෙන් ඇතිවූ ප්‍රතිඵලත් සමඟම යැපුම් ආර්ථිකය වානිජභෝග වගා කෙරෙන ආර්ථිකයක් ලෙස පරිවර්තනය විය. එනම් පැරණි කෘෂිකාර්මික සමාජය වානිජ භෝගයන් වෙත නැඹුරු වෙමින් මුදල් මත යැපෙන, ''ලාභය'' අපේක්ෂා කරන වානිජමය සමාජයක් ලෙස වෙනස් විය. මේ සමඟම ගොවියාගේ සාමූහික ජීවිතය, සංවිධානශීලී බව හා එකමුතුකම තුළින් කෘෂි ක්ෂේත්‍රයේ කටයුතු කිරීමේ හැකියාව දුර්වලව ගිය බව පෙනේ. මේ අනුව කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකය තුල පසුබැස්මකට ලක්වූ අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අප රට ආහාර ආයාත කරන රටක් බවට පත් විය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ගොවීන් මුහුණපාන අභියෝගයන්ට ඔවුන්ට හුදකලාව මුහුණදිය නොහැකි බවත් ගොවීන්ගේ අභාවයට ගිය සාමූහික බව නැවත මතු කරමින් කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කළ යුත්තේ ඔවුන් සංවිධානය කිරීම තුළින් බවත් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ගල්ගමුව සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය හඳුන්වා දීමේදී අරුත් ගෙන ඇත. මෙම නියාමක ව්‍යාපෘතිය තුළින් ඉදිරිපත් කළ අභ්‍යාසයන් හා එළ නෙලාගත් ක්ෂේත්‍රයන් මෙන්ම මෙය ක්‍රියාත්මක කිරීමේදී ලද ගැටළු, සීමා අත්දැකීම් ආදිය ආශ්‍රිතව සුළු ගොවීන් සංවිධානය කිරීම තුළින් ආර්ථික සංවර්ධනයට ලැබෙන පිටුවහල මෙහිදී සාකච්ඡාවට භාජනය වේ.

---

* මෙම ලිපියේ මුල් පිටපත සංස්කරණයේදී අගනා විමර්ශනාත්මක අදහස් දැක්වීම පිළිබඳව ලේඛකයා ආචාර්ය ජයන්ත පෙරේරා, ආර්. බී. සේනකආරච්චි, ඩී. ගමගේ සහ ගුණරත්න රාමනායක යන මහත්වරුන්ට ස්තූති කරයි.

ලංකාවේ ගැමි සමාජය තුළ ක්‍රියාත්මක වී පසුව අසාර්ථක වූ ගැමි සංවිධාන වන ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමූපකාර සමිති, ප්‍රජා මණ්ඩල, ග්‍රාමෝදය මණ්ඩල, එළදවර්ධන කමිටු ආදිය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම මෙහිලා වැදගත් වේ. ඉහත සඳහන් කළ සියළුම සමිතිවල බලවත්ව කටයුතු කළේ ගැමි සමාජය තුළ 90% ටත් වඩා නියෝජනය වන සාමාන්‍ය ගැමියා නොවේ; ග්‍රාමීය ප්‍රදේශ තුළ සිටින මධ්‍යම පංතියේ ඉඩම් හිමියන, පක්ෂ දේශපාලනයේ කැපී පෙනෙන්නන් සහ අධ්‍යාපන ක්‍රමය තුළින් වරප්‍රසාද යන් ලබාගත්, ගැමියන්ගේ වචනයෙන් හැඳින්වෙන ''වැදගත්'' (Elite Class) යයි හැඳින්වෙන පවුල්වල පුද්ගලයන්ය. කාලයක් තිස්සේ සිට දිගී බවේ සංස්කෘතියක් තුළ ජීවත් වූ ගැමියාගේ හා ඉහත කී වැදගත් යයි සම්මත පුද්ගලයින්ගේ ආකල්ප රටාවන් හා අපේක්ෂාවන් අතර පැහැදිලි වෙනසක් දක්නට හැකි විය. ගැමි සංවිධාන වලින් ගැමියා බලාපොරොත්තු වූ දෙයට වඩා හාත්පසින්ම වෙනස් වූ දෙයක් ඉටුවීම එම සංවිධානයන් වෙත ගැමි සහභාගිත්වය අඩුවීමට ප්‍රධාන හේතුවක් විය. පසුගිය රජය යටතේ ක්‍රියාත්මක වූ එළද-වර්ධන කමිටුව උදාහරණ වශයෙන් ගනිමු. එම කමිටුවේ තීරණ ගැනීමේදී වැදගත් ස්ථානයක් හිමිවූයේ ගොවීන්ට වඩා දේශපාලනික වශයෙන් බලපෑම් කළ හැකි, පුද්ගලයින්ටය. එළද වර්ධන කමිටුව තුළින් රජය බලාපොරොත්තු වූයේ සෑම ගොවියෙකුටම සමාන සේවයක් සපයමින් කෘෂිකාර්මික සංවර්ධනය ග්‍රාමීය මට්ටම තුළින් නගා සිටුවීම වුවත් ගම් මට්ටමේ දේශපාලනික බලවතුන් එහිදී තීරණ ගැනීම, ඒවා ක්‍රියාත්මක කිරීම හා තම පාක්ෂිකයිනට වැඩි සැළකිල්ළක් දක්වීම එහි අසාර්ථක භාවයට හේතුවිය.

1979 දී පණවන ලද ගොවිජන සේවා පනත මගින් විදානේ නමැති නිළය හඳුන්වා දුනි. මෙම නිළය පැරණි වැඩ වසම් සමාජයේ විදානේ නිළයට වඩා හාත්පසින්ම වෙනස්ය. පැරණි ක්‍රමය තුළ ගම් මට්ටමේ විදානේ වරයෙකු පත්කලේ ගමේ කටයුතු කෙරෙහි පුද්ගලයා තුළ තිබූ සමාජ, ආර්ථික බලපෑම පදනම් කරගෙනය. ඉඩම් හිමි බව, වැදගත් යයි සම්මත පවුලක පුද්ගලයෙකු වීම මෙන්ම පෞරුෂත්වය, නායකත්වය, ගම සංවිධානය කිරීමේ හැකියාව යන කරුණු මෙහිදී ප්‍රධාන විය. පැරණි විදානේ වරයෙකුට මේ අනුව ගැමියන් වෙනුවෙන් තීරණ ගැනීමේ හැකියාව මෙන්ම ඔවුන් වෙනුවෙන බලපෑම් කිරීමේ හැකියාව ද හිමි වූ අතර එම නිළය ප්‍රශ්න කිරීමකින් තොරව ගැමියා පිළිගත් බව පෙනේ.


සමාජය ක්‍රමයෙන් සංකීර්ණත්වයට පත්වීම. ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය දියුණුවීම හා ගැමි-යන්ගේ අදහස්, සිතුම් පැතුම් දියුණුවීමත් සමඟම, ඉහත සඳහන් කළ ආරෝපිත තත්ත්වයට ගැමියා ගරු කිරීමේ ක්‍රමය අහෝසි විය. 1979 පැන වූ නව ගොවිජන සේවා පනත යටතේ නව වෙල් විදානේවරුන් පත් කෙරිණ. මෙම පත්වීම ඔහු තහවුරු කර ගත්තේ තම ප්‍රදේශයේ ගොවීන්ගේ ඡන්දයෙන් වූ අතර එහිදී එම තනතුරට ඔහු සුදුස්සෙකු වීම සඳහා ගැමි නායකත්වය, කෘෂිකාර්මික කටයුතු වලට ඇති හැකියාව හා ගම් මට්ටමේ ජනප්‍රිය පුද්ගලයෙකු වීම යන කරුණු ප්‍රධාන විය. ගොවිජන සේවා පනත මගින බිහි වූ මෙම නව නායකත්වය ප්‍රධාන කොට කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමේ පරමාර්ථයෙන් ගැමියන් සංවිධානය කිරීම, නියාමක ව්‍යාපෘතියක් වශයෙන් හඳුන්වා දුන්නේ ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශය තුළ ය. මෙම කොට්ඨාශය තුල විදානේවරු (ගොවි නියෝජිතයන්) 61 ක් දෙනෙක් සිටිති. මින් තෝරාගත් 44 දෙනෙකු වෙත හඳුන්වා දුන් මෙම ව්‍යාපෘතිය යටතේ ඔවුන් නියෝජනය වූ ඒ ඒ කොට්ඨාශ තුළ ''සුළු පරිමාණ ගොවි සංවිධාන'' පිහිටුවීම කරන ලදී. මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වූ ගොවි පවුල් ගණන දළ වශයෙන් 6000 ක් පමණ වන අතර කුඹුරු අක්කර 13078 ක පමණ නිෂ්පාදන වපසරියක් අයත් විය. වෙල් විදානේ (ගොවි නියෝජිතයා) ලේකම් වශයෙන් පත්වූ මෙම ගොවි සංවිධානවල සාමාජිකත්වය එම ගොවි

නියෝජිත බල ප්‍රදේශයේ සියළුම ගොවීන්ට ලැබිය හැකි අතර පිළිවෙලින් සභාපති, භාණ්ඩාගාරික, ලේකම් යන තනතුරු වලින් හා කාරක සභිකයින් 06 දෙනෙකුගෙන් සැදුම්ලත් මඩුල්ලකින් මෙය සමන්විත විය.

මෙම ව්‍යාපෘතිය විෂය කොටගෙන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය බලාපොරොත්තු වූ පරමාර්ථයන් කැටි කරගතහොත් එය මෙසේ දක්විය හැක.

- යෙදවුම්, තාක්ෂණය, මූල්‍ය පහසුකම් හා වෙනත් අවශ්‍යතාවයන් සංවිධිතව යෙදවීම මගින් කෘෂි නිෂ්පාදනය වර්ධනය කිරීම.
- කෘෂි සැලසුම් සම්පාදනය සඳහා ක්ෂේත්‍ර මට්ටමේ සහභාගිත්වය ලබා ගැනීම වෙනුවෙන් සුළු ගොවීන් සංවිධානය කිරීම,
- සාමූහික ප්‍රයත්නයන් ඇතිකිරීම, ස්වශක්තිය තහවුරු කිරීම හා ඒ තුළින් ක්ෂේත්‍රය තුළදීම විසඳා ගත හැකි ප්‍රශ්න නිරාකරණයට ඉඩ සැලසීම,
- නිලධාරීන් හා නිලධාරීන් අතර සම්බන්ධීකරණය ගොවීන් හා ගොවීන් අතර සම්බන්ධීකරණය සහ ගොවීන් සහ නිලධාරීන් අතර සහයෝගිතාවක් ඇති කිරීමෙන් යහපත් සංනිවේදන රටාවක් ඇති කිරීම.

ඉහත සඳහන් පරමාර්ථයන් ඉටුකර ගැනීම විෂයෙහි ගොවිජන සේවා කමිටුව වෙත පැවරී ඇති වගකීම හා කාර්යභාරය විශාලය. මෙම සංවිධාන රටාවේ නායකයා වශයෙන් තම ප්‍රදේශයේ අනිකුත් ගොවීන්ගේ ඡන්දයෙන් පත්වූ ගොවි නියෝජිතයින් ගොවිජන සේවා කමිටුව වෙත ගොවි සංවිධානයේ ප්‍රශ්න ගෙන එන අතර කමිටුව විසින් ඒ සම්බන්ධයෙන් ලබාදෙන උපදෙස් ආදිය ගොවීන් වෙත (ගොවි සංවිධාන වෙත) ගෙන යාමේ සංනිවේදකයකුගේ කාර්යභාරය ඉටු කරයි. ගොවි සංවිධාන මසකට වරක් රැස්වන අතර එහිදී ගනුලබන තීරණ ප්‍රතිපත්ති හා ක්‍රියා දමයන් කමිටුව වෙත ගෙන යාම කෙසේ සිදුවේ දැයි පහත සඳහන් සටහන ඇසුරින් තේරුම් ගත හැකිය.




මෙම සංනිවේදනය ධූරාවලි ක්‍රමය යටතේ ඉහල සිට පහලටත් පහළ සිට ඉහලටත් තීරණ හා ප්‍රතිපත්ති ගෙන එන අතර මෙපමණ කලක් සිදුවූ ඉහල නිලධාරීන් විසින් පහල නිලධාරීන් වෙත නීති හා තීරණ ගෙන ඒමේ තත්ත්වය මෙයින් අවසන් වූ බව පෙනේ.

ගොවිජන සේවා කමිටු ප්‍රදේශය නියෝජනය කරන මුළු ගොවීන් සංඛ්‍යාව වන 61 දෙනාගෙන් ඉතා සමානුපාති ක්‍රමයකට අනුව ගොවි නියෝජිතයින් 06 දෙනෙකු කමිටුව වෙත නියෝජනය වීම මෙහි සාර්ථකත්වය කෙරෙහි බලපායි. ගොවි සංවිධාන ව්‍යාපෘතිය හඳුන්වා දුන් ගොවි නියෝජිතයින් 44 දෙනා ද සමානුපාතිකව කමිටුව වෙත නියෝජනයවී ඇත.

කම්ටුව
විදනේවරු (ගොවි නියෝජිතයින්) 06 දෙනා
විදනේවරු 44 දෙනා (ගොවි සංවිධාන හඳුන්වා දුන්)
විදනේවරු 61 දෙනා (මුළු ගොවිජන සේවා බල ප්‍රදේශය නියෝජනය කරන)

කුඩා පරිමාණ ගොවි සංවිධානවල නායකයින් වශයෙන් කටයුතු කරන විදනේවරු වරින් වර ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත කැඳවා විවිධ කෘෂි ක්ෂේත්‍රයන් පිළිබඳව පුහුණුවක් දෙනු ලැබිය. ජල පරිහරණය හා පාලනය, වාරිමාර්ග නඩත්තුව හා ඒවා ආරක්ෂා කිරීම, පොල් වගා සංවර්ධනය, සුළු අපනයන බෝග වගාව, පොහොර හා රසායන ද්‍රව්‍ය භාවිතය, නවීන තාක්ෂණය හා පැරණි තාක්ෂණය අතර වෙනස, සත්ව පාලනය, ආයතනික ණය ලබාගැනීම හා ග්‍රාමීය ඉතිරි කිරීමේ වැදගත්කම ආදිය පිළිබඳව ඔවුන් වෙත දැනුමක් ලබා දෙන ලදී. ඔවුන් විසින් ලබාගන්නා දැනුම ක්ෂේත්‍රය තුළදී තමා නියෝජනය කරන ප්‍රදේශයේ අන්කුත් ගොවීන් වෙත ලබාදීම ගොවි නියෝජිතයාගේ මූලික කාර්යභාරය වෙයි. මෙම පුහුණුවීම ගොවි නියෝජිතයන්ට පමණක් සීමා නොවන අතර, ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් භාරව කටයුතු කරන නිලධාරීන්ට ද. ගොවීන්ගේ ප්‍රශ්න විසඳන ආකාරය පිළිබඳව අවබෝධයක් ලබාදීමෙන් ගොවීන් හා නිලධාරින් අතර සුහදතාවයක් ඇති කිරීම ඉතා වැදගත් කොට සලකනු ලැබීය.

යහපත් සංනිවේදන ක්‍රියාවලියක යෙදෙන මෙම ගොවි සංවිධාන නියාමක ව්‍යාපෘතිය යටතේ නෙලාගෙන ඇති කෘෂිකාර්මික සංවර්ධනයන් රාශියකි. 1980-1981 මහ කන්නය සඳහා ඒ ඒ ගොවි සංවිධාන විසින් නිෂ්පාදන සැලැස්ම බැගින් ඉදිරිපත් කළ අතර එය ගුරු කොට ගෙන ප්‍රදේශයටම ගැලපෙන ආකාරයේ නිෂ්පාදන සැලැස්මක් ඉදිරිපත් කිරීමට හැකිවිය. සමූහ එකඟත්වයට මුල් තැන දෙමින් ඒ ඒ ප්‍රදේශයට අවශ්‍ය කරන යෙදවුම් වන බිත්තර වී, පොහොර වර්ග තීරණය කිරීම හා යෙදීම ආදියත් කලින් ඒ සඳහා සැලසුම් කිරීම ආදියත් මෙයින් සිදුවූ ඵලදායි ප්‍රතිඵල වශයෙන් පෙන්වා දිය හැක. මේ තත්ත්වය හේතුකොට ගෙන ගොවීන්ට 1980-1981 කන්නවල දි අක්කරයට බුසල් 120 ක පමණ වාර්තා ගත අස්වැන්නක් ලබාගත හැකි විය.

නව ව්‍යාපෘතිය හඳුන්වා දීමට ප්‍රථම කිසිදු ආයතනික ණයක් ලබාගැනීමේ නුසුදුස්සන් වශයෙන් සිටි ගොවීන් වෙත ණය ලබාදීම මේ තුළින් ලැබූ තවත් ප්‍රතිඵලයකි. බොහෝ ගොවීන්ගේ ආකල්පය වනුයේ රජයෙන් ලබා ගන්නා ණය මුදල් ආපසු ගෙවීම අනවශ්‍ය කරුණක් බවයි. මෙවැනි ආකල්පයක ගැමියා පිහිටා සිටීමට හේතුව, ඔස්කා ලෙවිස් (Oscar Lewis) නම සමාජ විද්‍යාඥයා වරක් දක්වූ පරිදි, ගැමියා දුගීකමේ සංස්කෘතියක් තුල ජීවත් වීමයි. පවතින රජය විවේචනය කිරීම, රජයේ නිලධාරින් කෙරෙහි ද්වේෂ සහගත අයුරින් කටයුතු කිරීම දුගී කමේ සංස්කෘතික කැපී පෙනෙන ලක්ෂණයක් බව ලතින් ඇමෙරිකානු ගැමි සමාජ ආශ්‍රයෙන් ලෙවිස් පෙන්වා දෙයි. මෙම තත්ත්වයම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ දක්නට ලැබිණ. මේ කරුණ ගැන විශේෂ අවධානයක් යොමු කරමින් ගොවීන් වෙත රජය දැඩි විශ්වාසයකින් කටයුතු කරන බව ඔවුන්ට අවබෝධ කර දෙමින් ගොවි සංවිධාන විසින් ණය ලැබීමට සුදුසු ගොවීන් නිර්දේශ කරන ලදී. මේ අනුව මුල් අවස්ථාවේදී ගොවීන් 58 දෙනෙකුට රු. 63000 ක ණය මුදලක් ලංකා බැංකුව මගින් ලබාදුන් අතර ණය ලබා දුන් ගොවීන්ගෙන් 100% ක්ම එය ආපසු ගෙවන ලදී. ආපසු ණය ගෙවීමේ කාර්යක්ෂමත වය කෙරෙහි පොදු සහතිකය, කණ්ඩායම් බලපෑම්, කන්නයේ යහපත් අස්වැන්න, දැඩි සුපරීක්ෂාකාරී බව හා ණය ලබා දෙන්නන් පිළිබඳව ගොවි සංවිධානයේ නිවැරදි නිර්දේශය හිතකරව බලපාන ලදී.

ගොවි සංවිධාන, කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි ආරම්භ කළ වැදගත් පියවරක් ලෙස කණ්ඩායම් සකසුරුවම පෙන්වා දිය හැක. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින කෘෂිකාර්මික රටක ගොවි ජනතාවගේ ඉතුරුම් හීනවන උපනතියක් පෙන්නුම් කරයි. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවන කරුණු දෙකක් දක්විය හැක. එනම් ගොවියා කාලයක් තිස්සේ සිට දුගී බව උරුම කරගෙන ලැබූ අඩු ආදායම් තත්වය පළමු කරුණ වශයෙන් හැඳින්විය හැක. දෙවැනි කරුණ නම් ඔග්බර්න් (Ogburn) නම් සමාජ විද්‍යාඥයා දක්වූ ආකාරයේ සංස්කෘතික ලැගීමක (Cultural lag) ගොවියා ජීවත් වීමයි. එනම් භෞතික වශයෙන් ඔහු වැඩි ආදායමක් ලැබුව ද අනාගතය වෙනුවෙන් යමක් ඉතිරි කිරීමේ වැදගත්කම, අවශ්‍යතාවය හා ඕනෑකම යන ලක්ෂණ වලින් ඔහු පිරිහී සිටීමයි.

මෙම තත්වයන් දෙක විද්‍යාත්මක පදනමක් යටතේ තේරුම් ගෙන ඔහුගේ ආදායම් තත්වය නඟා සිටුවන අතර, ඉතිරි කිරීමේ වැදගත්කම පිළිබඳව ද ඔවුන්ට අවබෝධයක් ලබාදෙන ලදී. සාමාන්‍යයෙන් මසකට වරක් රැස්වන ගොවි සංවිධාන වලදී ඒ ඒ ගොවි මහතා විසින් තීරණය කරනු ලැබූ කිසියම් ඉතිරි කිරීමේ වාරිකයක් කණ්ඩායම් නායකයා වෙත බාරදීමෙන් ඔවුන්ගේ පුද්ගලික ඉතුරුම් පුරුද්ද ආරම්භ කරනු ලැබීය. මෙම වාරිකය ශත 25 සිට රු. 1.00 දක්වා ප්‍රමාණයෙන් යුක්ත වී ඇති අතර කිසියම් සාමාජිකයෙකුට කෘෂි ක්ෂේත්‍රයේදී ණය අවශ්‍යතාවයක් වුවහොත් මෙම මුදල් ණය වශයෙන් ලබා ගැනීමේ හැකියාව ද ලැබිණ. 1982 වර්ෂයේ අවසන් තුන් මාසය වන විට එක් ගොවි සමිතියක් ඉතිරි කළ මුදල රු. 300 සිට රු. 600 දක්වා අතර ප්‍රමාණයක් විය. මේ අතර සමහර ගොවි සංවිධාන මෙම ඉතුරුම් මුදල් යොදවා කෘෂි රසායනික ඉන්ධන යන්ත්‍ර ආදිය මිලදී ගත් අවස්ථා ද දැකිය හැක.

මෙම ප්‍රදේශයේ ගොවි ජනතාවට කවදත් මුහුණ දීමට සිදුවන එක් ගැටළුවක් නම් ගොවි නිෂ්පාදන අලෙවියයි. අස්වැන්න නෙලන අවස්ථාවේ දී වෙළඳුන් විසින් කරනු ලබන මිල උච්චාවචනය ව්‍යාපෘති ප්‍රදේශය තුළ සාමාන්‍ය සංසිද්ධියකි. මෙම තත්ත්වයෙන් මිදීමට මෙම ප්‍රදේශයේ ගොවියාට නොහැකි වූ අතර පසුගිය 1980/81 කන්න වලදී වී බුසලකට පෞද්ගලික වෙළඳුන් විසින් ගෙවූ මුදල රු. 42 සිට 75 දක්වා වෙනස් විය. මෙම අවදානම සංකිල්ලට ගත් ගොවිජන සේවා කමිටුව, ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළදීම ගොවීන්ගේ නිෂ්පාදනයන් මිලදී ගැනීම කරන ලද අතර මීට අමතරව වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයේ ජංගම සේවාවක් ගොවීන් වෙත යවා නිෂ්පාදන මිලදී ගැනීමට ඉඩ පහසුකම් සලසා දෙන ලදී. ගොවි සංවිධාන ක්‍රියාත්මක වන ස්ථාන කිහිපයක මේ අනුව වී මිළදී ගැනීම සිදුවූ අතර ගොවි සංවිධාන විසින් ඒ සඳහා අවශ්‍ය ප්‍රචාරය, ගොවීන් උනන්දු කරවීම ආදී මූලික කාර්යයන්හි නිරත විය. මේ තත්ත්වය යටතේ අනාගත වෙළඳ පොළ වෙත බලපාන සාධක පිළිබඳව ද ගොවීන්ට අවබෝධයක් ලැබීමේ අවස්ථාව ද උදාවිය.

වී ගොවිතැන තමන්ගේ ප්‍රධාන ජීවන වෘත්තිය කර ගත් සමාජයක පවතින මූලික ගැටළුවක් නම් කෘෂිකාර්මික ශ්‍රම සැපයුමේ පවත්නා කාලීන හිඟයයි. පවුලේ ශ්‍රමය, කලට වේලාවට බිම් සකස් කර ගැනීමේ දී මෙන්ම අස්වනු නෙලා ගැනීමේදී කිසිසේත් ප්‍රමාණවත් නොවන බව ව්‍යාපෘති ප්‍රදේශයෙන් එක්නට ලැබුණකි. මේ තත්වයට විසඳුම් පැරණි කෘෂිකාර්මික සමාජය තුළ ක්‍රියාත්මක වූ ස්වේච්ඡා සංවිධාන මගින් ඉටු වූ බව පෙනේ. ''අත්තන්'' සහ ''මුත්තෙටු ක්‍රමයත්'' ''කයිය'' ක්‍රමයත් මගින් කෘෂි ජීවිතයේ අවශ්‍ය කරන ශ්‍රම සැපයුම කලට වේලාවට ලබා ගැනීම සිදුවිය. එහෙත් ක්‍රමයෙන් ගොවීන්ගේ ආර්ථික හා සමාජීය සහයෝගිතාවය විනාශ වී ගොස් පුද්ගලිකත්වය ඉස්මතු වූ අතර මේ නිසා ම කෘෂිකාර්මික ශ්‍රම හිඟය මෙන්ම ගොවි බලය ද නැති වී ගියේය. ව්‍යාපෘති ප්‍රදේශය තුළ ගොවීන් අතර අන්‍යොන්‍ය සුහදත්වය යළිත් මතුකොට ගොවීන් සමඟි කිරීම තුළින් නැතිවී ගිය පැරණි

සම්ප්‍රදායානුගත සිරිත් විරිත් හා ක්‍රම යළිත් නගා සිටුවීමට උත්සාහ කරන ලදී. මෙහිදී ''අත්තන් ක්‍රමය'' හා ''කයිය'' ක්‍රමය බෙහෙවින් ප්‍රයෝජනයට ගත් අතර ගොවි සංවිධාන වල නායකයින් මේ මගින් සාමාජිකයන්ගේ කුඹුරු සකස් කිරීමේ සිට අස්වනු නෙලා ගැනීම දක්වා කටයුතු වලට අවශ්‍ය කරන මිනිස් ශ්‍රමය ලබා දීමට පියවර ගනු ලැබීය. මේ අනුව වාරි ජලය නිකුත් කිරීමත් සමඟම කළයුතු බිම් සැකසීමත්, ක්ෂණිකව නිම කළයුතු අස්වනු නෙලීමට අවශ්‍ය කරන මිනිස් ශ්‍රමයත් සංවිධානශීලීව ලබාගත හැකි විය.

මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක තත්වයක පවතින ව්‍යාපෘතියක් වශයෙන් ලබාගත හැකි අත්දැකීම්, ගැටළු. අදහස්, උදහස් ආදිය ඉතා විශාල ය. ලංකාව වැනි දියුණුවෙමින් පවතින කෘෂිකාර්මික රටක ගොවියා මුහුණ දෙන ප්‍රශ්ණ මොනවාදැයි විද්‍යාත්මකව තේරුම් ගැනීමට මග පෑදීම මෙහිදී කැපී පෙනෙන විශේෂ ලක්ෂණයකි. විශේෂයෙන් මෙතෙක් ලංකාවේ ක්‍රියාත්මක වූ විවිධ ආයතන හා සංවිධාන ආදිය බොහෝ විට කටයුතු කලේ ඒ ඒ ප්‍රදේශයේ ගොවීන් මුහුණපාන ව්‍යුහමය සමාජ ආර්ථික හා සංස්කෘතික ලක්ෂණ කෙරෙහි අවබෝධයකින් නොවේ. ඔවුන්ට ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයද නොවීය. ගොවීන්ට අදළ තීරණ ගැනීමේ දී ගොවියාගේ කැමැත්ත හා අකැමැත්ත කුමක් වුවත් ගොවීන් වෙත ඒවා බලෙන් ආරෝපනය කිරීම නිලධාරින් විසින් මෙතෙක් අනුගමනය කළ එක් ක්‍රමයකි.

ගොවියා හා නිලධාරියා අතර පැවති සංස්කෘතිමය පරතරය මෙ ව්‍යාපෘතිය ආශ්‍රයෙන් පහසුවෙන් තේරුම් ගත හැකි විය. ගොවියාගේ අධ්‍යාපන ක්‍රමය, සිතුම් පැතුම්, ආකල්ප රටාව මෙන්ම අපේක්ෂාවන් ද නිලධාරියා තේරුම් නො ගැනීම කෘෂි සංවර්ධනයේ දී බලපෑ හැකි මූලික ගැටළුවේ.

පැරණි වෙල්විදානේ ක්‍රමය හා නව ගොවිජන සේවා පනත යටතේ බිහි වූ ගොවි නියෝජිත-යන්ගේ කාර්යභාරය අතර ඇතිවූ ''තත්ත්ව ගැටුම'' මෙම ව්‍යාපෘතිය පුරා විහිදී යන ගැටළුවකි. පැරණි වෙල්විදානේ ක්‍රමය වැඩවසම් සමාජයේ සමාජ තත්ත්වයන් විසින් උරුම කර දෙන්නක් විය. එහෙත් නව ගොවිජන සේවා පනත යටතේ බිහිවූ ''ගොවි නියෝජිතයා'' රජයට සම්බන්ධ වන්නේ නාම මාත්‍රික තත්ත්වයන් යටතේ පමණක් වන අතර ඔහුට වගා නිලධාරි වරයාගේ සහායකයකු ලෙස තම ප්‍රදේශයේ අනිකුත් ගොවීන්ගේ ඡන්දයෙන් පත්වී කටයුතු කිරීමට සිදුවිය. මෙම නව ගොවි නියෝජිතයා පැරණි ක්‍රමයේ ක්‍රියාත්මක වූ ''වෙල්විදානේ'' වරයෙකුට හිමි වූ නීතිමය බලතල හා සමාජ ගරු බුහුමන් පිළිබඳව සැසඳීමක යෙදෙන්නේ නව ක්‍රමය යටතේ තමන්ට එවැනි වරප්‍රසාදයන් නොමැති බව පිළිබඳව පසුතැවිල්ලකින් යුතු බව පෙනේ. එමෙන්ම පැරණි වෙල්විදානේ ක්‍රමය තුල මෙන් නීතිමය බලය තමන්ට නැතිකම ද ඔවුන්ගේ අප්‍රසාදයට හේතු වූවකි. මෙය එක් පැත්තකින් ඔවුහු තම ප්‍රදේශයේ අනිකුත් ගොවීන්ගේ ඡන්දයෙන් පත්වූ බව අමතක කිරීමකි. තවත් පැත්තකින් බලන කල ඔවුන්ට නීතිමය බලයක් නැතිකම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සිය කාර්ය ඉටු කිරීමේ දී බාධකයන් ඇති කරයි. වාරිමාර්ග කඩා බිඳ දමන ජලය නිසි ලෙස පාවිච්චි නොකරමින් සාපරාධී ක්‍රියාවන්හි යෙදෙන ගොවීන්ට විරුද්ධව කටයුතු කිරීමට ඔවුන්ට බලයක් නැත.

ව්‍යාපෘතියෙහි ගොවීන්ගේ සහභාගිත්වය පිළිබඳව කරුණු විග්‍රහ කිරීමේ දී ඔවුන්ගේ පාරම්පරික අදහස්, උදහස්, ආකල්ප රටාව මෙන්ම, දුගී කමේ සංස්කෘතික ලක්ෂණ විසින් උරුම කරදී ඇති රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාදමයන් විවේචනය කිරීම, නිලධාරි පංතිය වෙත ද්වේෂ සහගත බැල්මකින් යුතුව කටයුතු කිරීම වැනි කරුණු ප්‍රධාන වේ. එමෙන්ම මීට ඉහත දී හා දැනටමත් ක්‍රියාත්මක මට්ටමක පවතින යම් යම් සංවිධාන මගින් ගොවීන් වෙත ඉතිරි කොටදී ඇති අයහපත් අත්දැකීම් රටාව, මේ ව්‍යාපෘතිය වෙත ගොවි සහභාගිත්වය ඇතිවීමේදී බලපායි. නිලධාරීන්ගේ අයහපත් පාලනය අල්ලස් හා දූෂණ, පක්ෂ දේශපාලනය හා අනුග්‍රාහක-

අනුගාමික සම්බන්ධතාව ආදිය මේ අතරින් කැපී පෙනෙන ලක්ෂණ වේ. මීට අමතරව ගැමි සමාජයක් තුල බාහිරින් දිස්වන සංස්කෘතික ලක්ෂණයන්ට වඩා අභ්‍යන්තරයෙන් ක්‍රියාත්මක වන සංස්කෘතික චාරිත්‍ර ධර්ම රටාව ද ගැමි සහභාගිත්වය ව්‍යාපෘතිය වෙතට ලඟාවීමේදී බලපායි. බාහිරින් දිස්වන සංස්කෘතික ලක්ෂණ වශයෙන් සාමූහික ජීවිතයට කැමති බව, පොදු එකඟත්වයට පැමිණීම, තීරණ ගැනීම හා නායකත්වය ගෙන කටයුතු කිරීම වැනි ලක්ෂණයන් පෙන්වා දිය හැක. මීට අමතරව ගැමි සමාජය තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සංස්කෘතික ලක්ෂණ වශයෙන් තම අසල්වැසියන් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් කටයුතු කිරීම, අනවින කොඩිවින වැනි යාතු කර්මයන් තුලින් පලි ගැනීමට උත්සාහ කිරීම, තම සහෝදර ගැමියන්ගේ ජයග්‍රහණයන්ට නොකැමති බව වැනි ලක්ෂණයන් විශේෂයෙන් බලපායි. මෙම අභ්‍යන්තර හා බාහිර සංස්කෘතික ලක්ෂණ කුඩා පරිමාණ ගොවි සංවිධානයන් වෙත ගොවි සහභාගිත්වය ඇතිවීම තීරණය කරන මානව විද්‍යාත්මක හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය.

ගැමි කෘෂි කර්මාන්තය නගා සිටුවීමේ ප්‍රයත්නයන්හිදී මෙම ව්‍යාපෘතියෙන් ගත හැකි අත්දැකීම රාශියකි. විශේෂයෙන් ගොවීන්ට හුදෙකලාව තමන්ගේ කෘෂිකාර්මික ගැටළුවලට හා ඒ සම්බන්ධව බලපාන අභියෝගයන්ට මුහුණ දිය නොහැකි බව ඔප්පු වී හමාරය. එසේ නම් ගොවියාගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා මනාව සංවිධානය වූ එමෙන්ම කෘෂිකාර්මික ප්‍රශ්න විද්‍යාත්මකව තේරුම් ගත හැකි සංවිධාන රටාවක අවශ්‍යතාවය කැපී පෙනේ. ජල පාලනය, පොහොර භාවිතය නවීන කෘෂිකාර්මික තාක්ෂණය උපයෝගී කර ගැනීම මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී අවශ්‍ය කරන සංනිවේදනය, නිලධාරීන් අතර සමඟිය හා නිලධාරීන් හා ගොවීන් අතර සමඟිය ද ඉතා වැදගත් ය. මෙවැනි සංනිවේදන ඇති කළ හැකි එක් මාධ්‍යයක් ලෙස මෙම සුළු පරිමාණ ගොවි සංවිධාන ව්‍යාපෘතිය හැඳින්විය හැක. මෙම ව්‍යාපෘතිය පළමු පියවරේදී ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශය වෙත හඳුන්වා දුන් අතර අද එය දෙවන පියවර වන ගල්ගමුව ඡන්ද කොට්ඨාශය දක්වා ව්‍යාප්ත කිරීමේ කටයුතු කර ගෙන යයි. තෙවන පියවරේදී මෙය කුරුණෑගල දිස්ත්‍රික්කයටත්, අවසානයේ දී මුළු ශ්‍රී ලංකාවේ අනෙකුත් කෘෂිකාර්මික ප්‍රදේශයන් වෙතට ද හඳුන්වා දීමට බලාපොරොත්තු වේ.